# කාර්ය සාධන වාර්තාව

## நிருவாக அறிக்கை

## Performance Report

## 2014


**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

**குடிவரவு குடியகல்வுத் திணைக்களம்**

**Department of Immigration & Emigration**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, අංක 41, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.**

குடிவரவு குடியகல்வுத் திணைக்களம் இல 41,ஆனந்த ராஜகருணா மாவத்தை,கொழும்பு-10.

Department of Immigration & Emigration, N0 41, Ananda Rajakaruna Mawatha, Colombo 10.

දුරකථන අංකය/தொலைபேசி இல/Telephone No- +94 11 5329400

www.immigration.gov.lk

# පටුන


1. හැඳින්වීම 1
   - ❖ දැක්ම 1
   - ❖ මෙහෙවර 1
   - ❖ කාර්යභාරය 1
2. කාර්ය මණ්ඩල තොරතුරු 2
   - ❖ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 3
   - ❖ පුහුණු හා සංවර්ධන ඒකකය 4 - 6
3. විදේශ ගමන් බලපත් නිකුත් කිරීම හා සංශෝධනය 7
   - ❖ ප්‍රධාන කාර්යාලය 7
   - ❖ ප්‍රාදේශිය කාර්යාල 8
   - ❖ විදේශ ගමන් බලපත් සංශෝධනය හා අළුත් කිරීම් 9
   - ❖ එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයන් සඳහා ගමන් බලපත් නිකුත් කිරීම 10
4. වීසා හා ප්‍රත්‍යාන්ත පාලන කටයුතු 11
   - ❖ වීසා බලපත් නිකුත් කිරීම හා වීසා දිර්ඝ කිරීම 11 - 15
   - ❖ තොටුපල හා විමර්ශන අංශය 15 - 22
   - ❖ විමර්ශන අංශය 23 - 26
5. තොරතුරු තාක්ෂණ මෙහෙයුම් 27 - 28
6. පුරවැසි අංශය 29
7. ඉන්දු ලංකා පුරවැසි අංශය 30
8. සංවර්ධන , ප්‍රතිපත්ති හා ප්‍රතිසංස්කරණ අංශය 31 - 32
9. මූල්‍ය කළමනාකරණය 33 - 35
10. ප්‍රසම්පාදන කටයුතු 36
11. සුභසාධන කටයුතු 37 - 39

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## කාර්ය සාධන වාර්තාව

## 2014 වසර

## 01. හැඳින්වීම

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතෙහි විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුල්වීම පාලනය කිරීම සඳහාත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන වෙනත් පුරවැසියන් හා තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම සඳහාත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම සඳහාත් කටයුතු කිරීමේ බලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුවේ. ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම , විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ දරුවන් සඳහා මෙරට පුරවැසිභාවය ලබා දීම මෙන්ම ශ්‍රී ලාංකික පුරවැසිභාවය ඉල්ලුම් කරන ශ්‍රී ලාංකික නොවන තැනැත්තන් සඳහා මෙරට පුරවැසිභාවය ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

### දැක්ම

- කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම.

### මෙහෙවර

- ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින්, රටින් බැහැර වන්නන් හා ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම.

### කාර්යභාරය

- ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අනුෂාංගික කාර්යයන් ද, වීසා බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අනුෂාංගික කාර්යයන් ද, අනවසර විදේශීය සංක්‍රමණිකයන් ඉවත් කිරීම, ප්‍රත්‍යාන්ත පාලනය, විදේශ රටවල දී උපත ලද ශ්‍රී ලාංකීය දරුවන් ලියාපදිංචි කිරීම, ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ කටයුතු හා ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කටයුතු ඉටුකිරීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරයන් වේ.


## 02. කාර්ය මණ්ඩල තොරතුරු

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම ගණන් දීමේ නිලධාරියා වශයෙන් පාලක ජනරාල්වරයා වෙත වගකීම පැවරෙන අතර, ඔහුගේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ අතිරේක පාලක ජනරාල්වරයකු , පාලකවරුන් 05 දෙනෙකු හා ප්‍රධාන ගණකාධිකාරීවරයෙකු වෙත ඒ ඒ අංශවල වගකීම් පැවරී ඇත. දෙපාර්තමේන්තු ධුරාවලිය 2 පිටුවේ ඇති සංවිධාන සටහනෙන් දක්වා ඇති අතර, 2014 වසරේ සමස්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

| තනතුර | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු / අතිරික්ත |
|---|---|---|---|---|
| පාලක ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ) | 01 | 01 | - |
| අතිරේක පාලක ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ) | 01 | - | 01 |
| පාලක | ශ්‍රී ලං.ප.සේ. I | 05 | 05 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. I | 01 | 01 | - |
| නියෝජ්‍ය/ සහකාර පාලක | ශ්‍රී ලං.ප.සේ. II /III | 39 | 37 | 02 |
| නියෝජ්‍ය පාලක | දෙපාර්තමේන්තුමය | 02 | 01 | 01 |
| සහකාර පාලක | -එම- | 08 | 03 | 05 |
| ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. II | 02 | 02 | - |
| අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ. I | 01 | 01 | - |
| පරිපාලන නිලධාරී | රා.ක.ස. අධිපන්තිය | 02 | 02 | - |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී | දෙපාර්තමේන්තුමය | 36 | 21 | 15 |
| පද්ධති විශ්ලේෂක | ශ්‍රී ලං.තො.තා. සේවය | 01 | - | 01 |
| බලයලත් නිලධාරී | දෙපාර්තමේන්තුමය | 358 | 352 | 06 |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවා | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 02 | - | 02 |
| පුහුණු කළමනාකරු | ආශ්‍රිත සේවා | 01 | 01 | - |
| සංවර්ධන නිලධාරී | ආශ්‍රිත සේවා | 20 | 20 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | 368 | 305 | 63 |
| දත්ත සටහන්කරු | දෙපාර්තමේන්තුමය | 35 | 31 | 04 |
| පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තුමය | 01 | 01 | - |
| රියදුරු | රියදුරු සේවය | 29 | 24 | 05 |
| කා.සේ.සේ. | කා.සේ.සේවය | 104 | 101 | 03 |
| නියාමක | දෙපාර්තමේන්තුමය | 03 | 03 | - |
| **එකතුව** | | **1021** | **913** | **108** |

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ

# සංවිධාන ව්‍යුහය



## කාර්ය මණ්ඩල තොරතුරු (2014)

**(i) බඳවාගැනීම්**

**අ. බලයලත් නිලධාරීන් බඳවා ගැනීම් / උසස් කිරීම්**

2014 වර්ෂයට නව බඳවා ගැනීම් නොමැත. ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් බඳවා ගැනීම් පටිපාටිය අනුමත වන තෙක් රාජකාරි ඉටු කිරීම පිණිස වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත්කර ඇත.

**ආ. ගමන් බලපත්‍ර සහායක තනතුර සඳහා බඳවා ගැනීම**

2014 වර්ෂයට නව බඳවා ගැනීම් නොමැත. 2013.05.02 දින සිට බලපවත්වන පරිදි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ගමන් බලපත්‍ර සහායක තනතුරට අන්තර්ග්‍රහණය කර ලද නිලධාරීන් සඳහා වැටුප් පරිවර්තන සකස් කිරීම හා හිඟ වැටුප් ගෙවීමට කටයුතු කරන ලදී.

**(ii) කාර්යක්ෂමතා කඩඉම් විභාග**

බලයලත් නිලධාරීන්ගේ 2014 වසර සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2014.03.05 හා 2014.03.12 දිනයන්හි කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන් සේවා සමාගමට අයත් ශ්‍රවනාගාරයේ දී පවත්වන ලදී. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විභාග ප්‍රතිඵල 2014.06.02 දින නිකුත් කරන ලදී.

**(iii) ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ගැනීම් - 2014**

| සේවාව | දෙපාර්තමේන්තුවට පැමිණි සංඛ්‍යාව | පිටතට ස්ථාන මාරුවූ සංඛ්‍යාව | විශ්‍රාම ලැබූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 12 | 06 | - |
| සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) | - | - | 01 |
| බලයලත් නිලධාරි | - | - | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 57 | 24 | 12 |
| කාර්යාල කාර්ය සහයක සේවය | 22 | 10 | 04 |
| රියදුරු සේවය | - | 02 | 02 |
| **එකතුව** | **91** | **42** | **22** |

## පුහුණු හා සංවර්ධන ඒකකය.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඊට ගැළපෙන පරිදි මානව සම්පත් සංවර්ධන වැඩසටහන්,

- සැලසුම් කිරීම.
- සංවිධානය කිරීම.
- ක්‍රියාත්මක කිරීම හා ඒ ආශ්‍රිත අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම ආදී කටයුතු මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයන් වේ.

පාලක (පාලන) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක මෙම අංශයේ කාර්ය මණ්ඩලය, පුහුණු කළමනාකරු, රාජ්‍ය කළමණාකරන සහකාර තිදෙනෙක් හා කාර්යාල කාර්ය සහායකයෙකුගෙන් යුක්තවේ.

## 2014 වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

| වැඩමුළු පැවැත්වූ දින | වැඩමුළුව | පවත්වනු ලැබුවේ කා වෙනුවෙන්ද? | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 2014.01.01-08 | සේවාරම්භක පුහුණුව | වාර්ෂික ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් | 30 |
| 2014.01.09 | සනීපාරක්ෂක සේවා පුහුණුව | සනීපාරක්ෂක සේවා කාර්ය මණ්ඩලය | 25 |
| 2014.01.10 | ආරක්ෂක කටයුතු පුහුණුව | ආරක්ෂක නිලධාරීන් | 20 |
| 2014.01.16 | කාර්යාල ක්‍රම හා ආශ්‍රිත ප්‍රායෝගික ගැටළු | සියළුම ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩලය | 55 |
| 2014.01.20-24 | අනෙකුත් රටවල ගුවන් තොටුපොල සම්බන්ධ මගී නිෂ්කාෂණ පුහුණුව හා ලියවිලි පරීක්ෂාව | බලයලත් නිලධාරීන් | 80 |
| 2014.02.20 | ඉංග්‍රීසි වාර්තා රචනය | මාණ්ඩලික හා බලයලත් නිලධාරීන් | 35 |
| 2014.03.17-21 | පරිගණක පුහුණුව | කළමණාකරන සහකාර | 50 |
| 2014.04.25 | තරඟ විභාගයන් සඳහා තම දරුවන් පෙර සූදානම් කරන්නේ කෙසේද ? | තරඟ විභාග සඳහා පෙනී සිටින දරුවන් ඇති කාර්ය මණ්ඩල දෙමාපියන් | 15 |
| 2014.05.08/09 | පරිගණක පුහුණුව | කළමනාකරණ සහකාර | 20 |
| 2014.05.15/16 | නීතිමය වාර්තා රචනා කිරීම | බලයලත් නිලධාරීන් | 40 |
| 2014.05.30 | ළමා අපචාර වලින් ළමුන් වළක්වා ගැනීම | විවෘත | 50 |
| 2014.06.06 | පරිගණක පුහුණුව | කළමනාකරණ සහකාර | 15 |
| 2014.06.09/10 | අනෙකුත් රටවල ගුවන් තොටුපොල සම්බන්ධ මගී නිෂ්කාෂණ පුහුණුව හා ලියවිලි පරීක්ෂාව | බලයලත් නිලධාරීන් | 20 |
| 2014.06.17/18 | අනෙකුත් රටවල ගුවන් තොටුපොල සම්බන්ධ මගී නිෂ්කාෂණ පුහුණුව හා ලියවිලි පරීක්ෂාව | බලයලත් නිලධාරීන් | 20 |
| 2014.06.25/26 | අනෙකුත් රටවල ගුවන් තොටුපොල සම්බන්ධ මගී නිෂ්කාෂණ පුහුණුව හා ලියවිලි පරීක්ෂාව | බලයලත් නිලධාරීන් | 20 |
| 2014/07/09-11 | පරිගණක පුහුණුව | බලයලත් නිලධාරීන් | 30 |
| 2014.08.21 | ගමන් බලපත් නිකුත් කිරීමේ ක්‍රියාදාමය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් | 40 |
| 2014.09.04-05 | පරිගණක පුහුණුව | බලයලත් නිලධාරීන් | 15 |
| 2014.09.11-12 | සේවාරම්භක පුහුණුව - 02 | ප්‍රමාද වී ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් | 40 |
| 2014.10.15-17 | පරිගණක පුහුණුව | බලයලත් නිලධාරීන් | 40 |
| 2014.11.20 | ගමන් බලපත් නිකුත් කිරීමේ ක්‍රියාදාමය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් | 45 |
| 2014.12.22-23 | අද්විතීය පාරිභෝගික සත්කාරය | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් | 25 |

# 2014 වසරේ පවත්වන ලද  පුහුණු වැඩසටහන්







# 03. විදේශ ගමන් බලපත් නිකුත් කිරීම හා සංශෝධනය

2014 ගමන් බලපත් අංශය, මෙම දෙපරේතමේන්තුවේ සේවය ලබා ගැනීමට මහජනයා වැඩිපුරම පැමිණෙන අංශය වේ. ගමන් බලපත්‍ර ලබා ගැනීම , අළුත් කිරීම හා ඒවායේ විවිධ සංශෝධන සඳහා ප්‍රධාන කාර්යාලයට අමතරව මහනුවර, වවුනියාව හා මාතර ප්‍රාදේශීය කාර්යාල 03ක් පිහිටුවා ඇත.


**<u>ප්‍රධාන කාර්යාලය</u>**

වර්ෂයේදී ප්‍රධාන කාර්යාලයේ ගමන් බලපත් අංශයෙන් නිකුත් කරන ලද ගමන් බලපත් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | සියලු රටවල් | ඉන්දීය සීමිත (දඹදිව යාම) | මැද පෙරදිග | [illegible] | රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත් | රාජකාරී | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 234,943 | 14,786 | 198,815 | 06 | 309 | 1,404 | 449,902 |

## 2009 සිට 2014 දක්වා ගමන් බලපත් නිකුත් කිරීම් (ගමන් බලපත්‍ර වර්ග අනුව)

| | සියලු රටවල් | රාජ්‍ය තාන්ත්‍රික | ඉන්දීය සීමිත | [illegible] | මැද පෙරදිග | රාජකාරී | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2014** | 234,943 | 309 | 14,786 | 6 | 198,815 | 1,043 | 449,902 |
| **2013** | 284,231 | 338 | 17,611 | 6 | 214,352 | 998 | 517,536 |
| **2012** | 303,524 | 288 | 35,697 | 4 | 230,482 | 899 | 570,894 |
| **2011** | 285,724 | 358 | 39,611 | 8 | 196,516 | 995 | 523,212 |
| **2010** | 278,242 | 396 | 28,792 | 7 | 199,621 | 891 | 507,949 |
| **2009** | 251,544 | 309 | 22,601 | 18 | 209,858 | 680 | 485,010 |




**<u>ප්‍රධාන කාර්යාලයේ එක්දින සේවයෙන් ගමන් බලපත්‍ර ලබා ගැනීමට පැමිණ සිටින පිරිස</u>**




**<u>ප්‍රාදේශීය කාර්යාල මඟින් ගමන් බලපත්‍ර නිකුත් කිරිම - 2014</u>**


| | සියලු රටවල් | හදිසි සහතික (දඹදිව යාම) | මැද පෙරදිග | රාජකාරී | එකතුව |
|---|---|---|---|---|---|
| **මහනුවර** | 26,601 | 5,052 | 9,748 | 01 | **41,402** |
| **වවුනියාව** | 14,245 | 485 | 4,990 | - | **19,720** |
| **මාතර** | 12,733 | 1,235 | 2,437 | 01 | **16,406** |

## <u>ගමන් බලපත් සංශෝධන හා අළුත් කිරීම</u>

2014 වර්ෂයේ ශ්‍රී ලාංකික ගමන් බලපත්‍ර අළුත් කිරීම් හා වෙනස් කිරීම් ප්‍රමාණය 87,486 ක් විය.

## <u>ගමන් බලපත් සංශෝධනය (2010 සිට 2014 දක්වා)</u>

| වර්ගය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | එකතුව |
|---|---|---|---|---|---|---|
| සියලු රටවල් සඳහා වලංගු කිරීම | 17,742 | 15,746 | 1,496 | 2,557 | 473 | 38,014 |
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | 1,165 | 957 | 667 | 541 | - | 3,330 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 1,527 | 1,356 | 1,264 | 1,309 | 1151 | 6,607 |
| ද්විත්ව පුරවැසිභාවය මාරු කිරීම | - | - | - | - | 11 | 11 |
| ළමයින් ගමන් බලපත්‍රයන් ඉවත් කිරීම | 2,384 | 2,659 | 2,656 | 2,361 | 2219 | 12,279 |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 2,513 | 1,906 | 1,496 | 1,671 | 2070 | 9,656 |
| ළමයින් ඇතුළත් කිරීම | 2,706 | 2,529 | 2,207 | 1,856 | 1496 | 10,794 |
| විවාහයට පෙර නම යෙදීම | 38 | 24 | 34 | 40 | 16 | 152 |
| නම වෙනස් කිරීම | 4,275 | 4,449 | 3,984 | 3,399 | 3119 | 19,226 |
| විවාහයට පසු නම යෙදීම | 2,323 | 2,211 | 2,224 | 2,036 | 2033 | 10,827 |
| වෙනත් සංශෝධන(ගාස්තු රහිත) | 111 | 121 | 137 | 151 | 81 | 601 |
| වෙනත් සංශෝධන 01 | 28,970 | 29,043 | 33,316 | 27,462 | 28,669 | 147,460 |
| වෙනත් සංශෝධන 02 | 1,027 | 1,418 | 1,363 | 995 | 913 | 5,716 |
| වෙනත් සංශෝධන 03 | 28 | 56 | 28 | 27 | 17 | 156 |
| නම මාරුකිරීම(වෙනත්) | 0 | 0 | 2 | 7 | 3 | 12 |
| තනතුර මාරුකිරීම | 50,046 | 46,542 | 47,347 | 55,655 | 66,922 | 266,512 |
| තනතුර මාරුකිරීම(ගාස්තු රහිත) | 1 | 1 | 2 | 2 | | 6 |
| කාලය දීර්ඝ කිරීම | 115,337 | 59,084 | 28,740 | 10,384 | 2,368 | 215,913 |
| ළමුන්ගේ අළුත් ඡායාරූප ඇතුළත් කිරීම | 86 | 118 | 93 | 137 | 135 | 569 |
| එකතුව | **230,279** | **168,220** | **127,056** | **110,590** | **111,696** | **747,841** |




## එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයන් සඳහා ගමන් බලපත් නිකුත් කිරීම

එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් විදේශ දූත මණ්ඩල අංශය වෙත ඉදිරිපත් කරයි. ඒ අනුව 2014 වර්ෂයේ එම අංශයට සේවාලාභීන් 39,811 ක් විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇත.

# 04. වීසා අංශය හා ප්‍රත්‍යන්ත පාලන කටයුතු

ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත වන බවට සහතික කරමින් ජාතික සංවර්ධනයට දායකවීම වීසා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වේ. **1948** අංක **20** දරණ ආගාමික හා විගාමික පනතේ III කොටස මඟින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කරයි. ඒ යටතේ **1952** ආගමන හා විගමන රෙගුලාසි අංක **02** සිට අංක **35** ප්‍රකාරව ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා වීසා බලපත් නිකුත් කිරීම හා වීසා දීර්ඝ කිරීම සිදු කරයි. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින්ට මෙරට තුළ නීත්‍යානුකූලව රැඳී සිටීම සඳහා වලංගු වීසා නිකුත් කිරීමද මෙම අංශය මඟින් සිදු කෙරේ.

**වීසා බලපත් නිකුත් කිරීම හා වීසා දීර්ඝ කිරීම**

## <u>2014 ප්‍රගතිය</u>

2014.01.01 සිට 2014.12.31 වර්ෂය තුළ පූර්ව අනුමැතීන් ලබාදීම්, නව වීසා නිකුත්කිරීම් සහ දීර්ඝ කිරීම් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පූර්ව අනුමැතීන් ලබාදීම් | **12,482** |
| 02 | නව වීසා නිකුත් කිරීම් (වාස වීසා) | **19,298** |
| 03 | වීසා දීර්ඝ කිරීම්<br>1. වාස වීසා<br>2. සංචාරක වීසා | **22,008**<br>**54,322** |
| 04 | සාර්ක් වීසා | **664** |

**ඒ ඒ වීසා වර්ග යටතේ 2014.01.01 සිට 2014.12.31 දක්වා වාස වීසා දීර්ඝ කිරීම් හා නිකුත් කිරීම්**

| කාණ්ඩය | දිර්ඝ කිරීම් | නිකුත් කිරීම් | තානාපති කාර්යාල වෙත යවනු ලැබූ ෆැක්ස් පණිවුඩ | ගුවන් තොටුපල වෙත යවනු ලැබූ පණිවුඩ (Landing Endorsement) |
|---|---|---|---|---|
| ආයෝජන මණ්ඩලවල සේවයේ නියුතු | 4015 | 2364 | 2948 | 129 |
| ශ්‍රී ලාංකික දෙමාපියන්ගේ දරුවන් | 141 | 169 | | |
| පුරවැසි පනතේ 5.2 වගන්තිය යටතේ | | 1581 | | |
| පුරවැසි පනතේ 5.11 වගන්තිය යටතේ | | 471 | | |
| පූජ්‍ය පක්ෂය | 852 | 266 | 242 | 29 |
| රාජකාරී | 243 | 589 | 240 | 21 |
| ද්විත්ව පුරවැසි (ශ්‍රී ලාංකික) | | 269 | | |
| කලින් ශ්‍රී ලාංකිකයින්ව සිටි | 2106 | 1475 | | |
| රාජ්‍යය නොවන සංවිධාන | 460 | 257 | 462 | 103 |
| පුද්ගලික අංශයේ සේවයේ නියුතු | 2337 | 2432 | 1720 | 103 |
| ලියාපදිංචි ඉන්දියානුවන් | 35 | 3 | | |
| ආගමික කාර්යයන් සඳහා පැමිණි | 317 | 429 | 648 | 26 |
| ආගන්තුක වීසා (RGS) | 19 | 13 | | |
| ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ කලත්‍රයන් | 3343 | 1016 | | |
| SSRV | 132 | 53 | | |
| රාජ්‍ය අංශයේ සේවයට පැමිණි | 3760 | 3805 | 3382 | 49 |
| ශිෂ්‍ය / ශිෂ්‍යත්වලාභීන් | 3868 | 3097 | 1747 | 168 |
| උසාවි නියෝග | 83 | 12 | | |
| වෛද්‍ය හේතූන් මත පැමිණි | 284 | 240 | 1 | |
| රාජ්‍යතාන්ත්‍රික | 13 | 757 | 175 | 5 |
| **එකතුව** | **22008** | **19298** | **11565** | **633** |
| | **41306** | | **12198** | |
| **මුළු එකතුව** | **53504** | | | |

උක්ත කාර්යයට අමතරව පහත කටයුතු මෙම වර්ෂය තුල වීසා අංශය මඟින් සිදු කරන ලදී.

1. වීසා නිකුත් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයන්හි දී අනාවරණය වූ කරුණු වලට අදාලව හෝ ආගමන හා විගමන පාලක ජනරාල් වෙත ලැබුණු පැමිණිලි විභාගයෙන් අනතුරුව හෝ වීසා ලබා දීමට පාදක වූ ආයතන හා සම්බන්ධිත පුද්ගලයන්ගේ ඉල්ලීම් මත හෝ ලබා දී තිබූ වීසා අවලංගු කිරීම සහ අසාධු ලේඛන ගත කිරීම.
2. 2014 වර්ෂය තුළ ඇතිවූ ජාතික ආරක්ෂාව පිළිබඳ විශේෂ තත්ත්ව යටතේ පාකිස්තානු, නයිජීරියානු හා සිරියානු ජාතිකයින් මෙරටට පැමිණීමේදී රාජ්‍ය බුද්ධි අංශයට යොමු කර ආරක්ෂක නිෂ්කාෂණ ලබා ගැනීම.
3. පශ්චාත් යුධ සමයේ රාජ්‍ය ආරක්ෂාව වඩාත් තහවුරු කිරීමට රාජ්‍ය නොවන සංවිධාන වල කටයුතු සඳහා පැමිණෙන විදේශිකයන්ට වීසා නිකුත් කිරීමේදී සහ දීර්ඝ කිරීමේදී රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ නිර්දේශ ලබා ගැනීම අනිවාර්ය කිරීම.

4. ශිෂ්‍ය වීසා ලබා ගනිමින් රටතුල සිටින මාලදිවයින් ශිෂ්‍යයින් , ඔවුන්ගේ යැපෙන්නන් හා භාරකරුවන් පසුගිය වර්ෂ කිහිපය තුළ විශාල ප්‍රමාණයකින් වර්ධනය වී තිබේ. සංචාරක වීසා ලබාගනිමින් පැමිණෙන මාලදිවයින් ශිෂ්‍යයන් හා යැපෙන්නන් මෙරටට පැමිණි පසු තම වීසා, ශිෂ්‍ය වීසා බවට පත්කරගැනීමට තිබූ හැකියාව ගැටළු මතු කරන්නක් බව පෙණිනි. පූර්ව අනුමැතියක් නොලබා රටට පැමිණි පසු ගාස්තු ගෙවීමකින් තොරව මාස තුනක් සංචාරක වීසා යටතේ සිට එක්වරම වාස වීසා සඳහා අයදුම් කිරීමෙන් සහ ඔවුන්ගේ පාඨමාලා පිළිබඳ කිසිදු අධිකාරියකින් නිර්දේශ ලබාගැනීමක් සිදු නොකිරීමෙන් මාලදිවයින් ශිෂ්‍ය වීසා අනුමැතිය සඳහා ගනු ලබන තොරතුරු ප්‍රමාණවත් නොවන බව පැහැදිලිව පෙණිනි. එහෙයින් තවදුරටත් මාලදිවයින් ශිෂ්‍ය වීසා නිකුත්කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති කඩිනමින් සකස්කළ යුතු බව අනාවරණය විය. මේ යටතේ පූර්ණ කාලීන පාඨමාලා හදාරන්නන්ට පමණක් ශිෂ්‍ය වීසා නිකුත් කිරීම ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා අදාල අධ්‍යාපන ආයතන මඟින් අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා විශේෂ දත්ත පෝරමයක් සකස් කරන ලදී.

5. නයිජීරියා, කෙන්යා, ගිනිබිසව්, සුඩාන්, ගැබෝ, උගන්ඩා, කොන්ගෝ යන රටවල පැතිරගිය එබෝලා වසංගතය හේතුවෙන් විද්‍යුත් සංචරණ ක්‍රියාවලිය මඟින් උක්ත රටවලට වීසා ලබාදීම තාවකාලිකව අත්හිටවූ අතර, එම රටවල් වල ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල මඟින් පමණක් වීසා අයදුම්පත් භාර ගන්නා ලදී. එහි දී සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිර්දේශ කළ වෛද්‍ය පරීක්ෂණයකින් අනතුරුව වීසා නිකුත් කිරීම සිදුවිය.

6. අයදුම්පත් පරිකේතනය කිරීමේ ක්‍රමවේදය පසුගිය වසර තුළද ක්‍රියාත්මක නොවූ බැවින්, එකතු වී තිබූ වීසා ගොනු ප්‍රමාණයන් තැන්පත් කිරීම සඳහා ඉඩකඩ ගැටළුව පැණ නැගී තිබිණි. වසර පහකට වඩා පැරණි වූ භාවිත නොකරන වීසා ගොනු නියමිත අනුමැතීන් ලබා ඉවත්කළ අතර අංශයේ බිත්ති අල්මාරි අළුතින් සකස්කර ඒවා විෂය භාර නිලධාරීන්ට ගොනු ඇසිරීම සඳහා වෙන්කරන ලදී.

7. සේවය ලබාගැනීමට වීසා අංශයට පැමිණෙන සේවාලාභීන් හට තම අයදුම්පත් පිරවීමට පැවතියේ ලියන මේස දෙකක් පමණක් වූ අතර එම ලියන මේස දෙක ඒ සඳහා කිසිසේත් ම ප්‍රමාණවත් නොවිණි. එහෙයින් පෙර පැවති ප්‍රමාණයට වඩා විශාල නව ලියන මේස දෙකක් ද, වීසා පරිශ්‍රය තුළ ස්ථාපනය කෙරිණි. මෙයට අමතරව සුබසාධක සංගමය මඟින් ලබාදුන් රූපවාහිනී යන්ත්‍ර දෙකක් ද සේවාලාභීන්ගේ භාවිතය සඳහා සවිකරන ලදී.

8. වීසා අංශයේ පාලකතුමන් වූ එම්. එන්. රණසිංහ මහතා දෙපාර්තමේන්තුවෙහි පාලක ජනරාල් ලෙස ඔක්තෝබර් මස දහ හතරවන දින උසස්වීමක් ලැබූ අතර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පාලක අයි.සී. පතිරාජ මහතාගේ අධීක්ෂණය යටතේ වීසා අංශයේ කටයුතු සිදු කෙරිණි.

9. ගමන් බලපත් අංශයේ සහකාර පාලකවරුන්ට වීසා අංශයේ කටයුතු පිළිබඳව අවබෝධයක් ලබාදීම සඳහා සතියකට එක් සහකාර පාලකවරයෙක් බැගින් වීසා අංශයේ සේවය සඳහා යෙදවිණි. මේ සඳහා පවතින වීසා කවුළු ප්‍රමාණවත් නොවූ බැවින් අංශයට ඇතුළුවීමට පැවති ඉඩකඩ භාවිත කරමින් නව කවුළුවක් ස්ථාපනය කරන ලද අතර ඇතුළුවීම සඳහා වෙනත් ස්ථානයක දොරටුව ස්ථාපනය කරන ලදී.

10. වාස වීසා භාරගැනීමේ කුවිතාන්සි නිකුත් කිරීමට භාවිත වන හයවන කවුළුව සඳහා කාර්යමණ්ඩලයේ ස්ථිර නිලධාරියකු නොමැති වීමෙන් ගැටළු විසඳීම සඳහා සංවර්ධන නිලධාරීන් ලෙස නවක පත්වීම් ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරිණියක් පුහුණු කර ඒ සඳහා යෙදවිණි.

## 2015 වර්ෂය සඳහා අපේක්ෂිත ව්‍යාපෘතීන්

1. වීසා ස්ටිකරය භාවිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
2. වීසා තොරතුරු පද්ධතිය යාවත්කාලීන කරමින් එහි දුර්වලතාවන් මගහරවා ගැනීම සහ තොරතුරු පද්ධතිය දත්ත විශ්ලේෂණය සඳහා ඵලදායී ලෙස යොදාගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම.
3. වීසා කාණ්ඩ සඳහා වඩාත් සුදුසු වීසා ප්‍රතිපත්තීන් දියුණු කිරීම.
4. වීසා අයදුම්පත් සහ සහායක ලේඛන පරිලෝකණය කිරීම සඳහා කටයුතු කිරීම මඟින් ගොනු කළමනාකරණය විධිමත් කිරීම.
5. වීසා අංශය තුළ සේවාලාභීන් හැසිරවීම සඳහා වඩා විධිමත් අංක ක්‍රමයක් හඳුන්වා දීම සහ මහජන ඇමතුම් පද්ධතිය විධිමත් කිරීම.

## ඉ සංචරණ අනුමැතිය (ETA)

ඉ සංචරණ අනුමැතිය යටතේ 2014 වර්ෂයේදී විදේශිකයින් සඳහා Tourist , Business , Transit හා Gratis ETA ප්‍රදානය කිරීම සාර්ථකව සිදුකරන ලදී. ETA පද්ධතියේ ගුණාත්මක බව වැඩි කිරීම හා ගැටළු වලින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම උදෙසා පහත සඳහන් අළුත් යෙදුම් හා ක්‍රියාකාරකම් පද්ධතිය වෙත ස්ථාපනය කරන ලදී.

1. Application error handling ක්‍රමවේදයක් ස්වයංක්‍රීයව සිදුවන ආකාරයට පද්ධතිය වෙනස් කිරීම. මෙමඟින් පද්ධතියේ ගැටළුවක් උද්ගත වූ අවස්ථාවේම අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව සැලසේ.

2. Tourist , Business , Transit හා Gratis ETA සඳහා නව Approval Notice ආකෘති පත්‍ර හඳුන්වා දීම.

3. ශ්‍රී ලංකාව හා අනෙකුත් රටවල් අතර ඇති කර ගන්නා වීසා ගිවිසුම් අනුව නිදහස් කිරීම් පිළිබඳ තොරතුරු වෙබ් අඩවියේ ඇතුළත් කර යාවත්කාලීන කිරීම.

4. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පාකිස්ථාන, ඇෆ්ගනිස්ථාන හා ඉන්දියානු ජාතික ETA අයදුම්පත්‍ර රාජ්‍ය බුද්ධි අංශයේ විශේෂ අධීක්ෂණයකින් පසු අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදයක් ඇරඹීම.

5. Business ETA ගුවන්තොටුපල කවුළුවෙන් නිකුත් කිරීමේදී ඇතිවූ ගැටළු සහගත තත්ත්වයන් හේතුවෙන් Business ETA ගුවන්තොටුපල කවුළුවෙන් නිකුත් කිරීම 2014-07-16 දින සිට නවතා දැමීම.

6. අප්‍රිකානු අර්ධද්වීපයේ පැතිර ගිය එබෝලා වෛරසය නිසා ශ්‍රී ලංකාවට පැමිණෙන අප්‍රිකානු ජාතිකයින් පිළිබඳ ආරක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ETA පද්ධතියේ වෙනස්කම් සිදු කිරීම.

7. ETA අනුමැතිය තාවකාලිකව අත්හිටුවා ඇති බව අදාල අයදුම්කරුවන්ට දන්වා යවන ක්‍රමයක් පද්ධතිය තුල ස්ථාපනය කිරීම.

8. On Arrival ETA නිකුතුවට අදාල තොරතුරු Front End පද්ධතියට ඇතුළත් කල හැකි වන පරිදි පද්ධතිය සංවර්ධනය කිරීම.

9. රාජ්‍ය ආයතන සංවිධානය කරන විදේශීය නියෝජිතයින් සහභාගීවන උත්සව සඳහා Business ETA ගුවන් තොටුපල පැමිණීමේ ETA කවුළුවෙන් ලබාගත හැකි පරිදි පද්ධතිය සංවර්ධනය කිරීම.

10. ETA අයදුම්කිරීමේ දී ඇතුළත් කරන තොරතුරු වැරදීම නිසා ඒ මත නිකුත් වන වැරදි ETA අනුමැතියන් හා ගමන් බලපත්‍ර තොරතුරු වෙනස් වීම හේතුවෙන් ගුවන් තොටුපල පැමිණීමේ කවුන්ටර වලදී සිදුවන අපහසුතාවලින් විදේශිකයන් මුදවා ගැනීම සඳහා ETA Match Function හඳුන්වා දීම.

11. කණ්ඩායමක් ලෙස ETA අයදුම් සඳහා ගෙවීම් කිරීමේ දී නිකුත් කරන ETA Receipt පත්‍රයේ කණ්ඩායමේ සියළුම සාමාජිකයන්ගේ ගෙවීම් තොරතුරු ඇතුළත් කිරීම.

12. ETA පද්ධතියේ මන්දගාමී ක්‍රියාකාරීත්වය නැතිකර එය ජවසම්පන්න කිරීමට අදාල පද්ධති වෙනස්කම් කිහිපයක් සිදු කිරීම.

## <u>තොටුපල හා විමර්ශන අංශය</u>

ප්‍රධානම කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකාවේ නියමිත තොටුපලවල් හරහා සිදුවන මගීන්ගේ ගමන් බිමන් පාලනය කිරීම ( ප්‍රත්‍යන්ත පාලනය) වන අතර, එයට අදාල වෙනත් ආධාරක සේවා සැපයීම සහ විමර්ශන කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

**<u>ගුවන් තොටුපලවල්</u>**

I. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල
II. රත්මලාන ගුවන් තොටුපල
III. පලාලි ගුවන් තොටුපල
IV. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල

**<u>වරායවල්</u>**

I. කොළඹ වරාය
II. ගාල්ල වරාය
III. මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය
IV. ත්‍රිකුණාමල වරාය
V. කන්කසන්තුරේ වරාය
VI. තලෙයිමන්නාරම ජැටිය
VII. නොරොච්චෝලේ වරාය
VIII. ඔලුවිල් වරාය

## මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායෙහි පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යාලය











## ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයින්, පැමිණි හා පිට වූ සංඛ්‍යාව - 2014

| | පැමිණි සංඛ්‍යාව | පිට වූ සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකා පුරවැසි | 1263679 | 1311258 |
| විදේශික | 1610530 | 1604679 |
| එකතුව | **2874209** | **2915937** |

ශ්‍රී ලාංකිකයන්ගේ හා විදේශිකයන්ගේ පැමිණීම - 2014




ශ්‍රී ලාංකිකයන්ගේ හා විදේශිකයන්ගේ පිටවීම - 2014





## එක් එක් තොටුපලවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2014


| අනු අංකය | තොටුපල | පැමිණි සංඛ්‍යාව | පිටත් වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කටුනායක ගුවන් තොටුපල | 2840257 | 2884765 |
| 2 | හම්බන්තොට වරාය | 122 | 173 |
| 3 | මත්තල ගුවන් තොටුපල | 4052 | 3256 |
| 4 | කොළඹ වරාය | 6710 | 7196 |
| 5 | ගාල්ල වරාය | 22658 | 20143 |
| 6 | මන්නාරම ජැටිය | 0 | 1 |
| 7 | ත්‍රිකුණාමලය වරාය | 398 | 384 |
| 8 | රත්මලාන ගුවන් තොටුපල | 12 | 19 |
| | **එකතුව** | **2874209** | **2915937** |

## ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව මහද්වීප මට්ටමින් - 2014

| මාසය | අප්‍රිකාව | ආසියාව | ඔස්ට්‍රේලියාව | යුරෝපය | උතුරු ඇමරිකාව | දකුණු ඇමරිකාව | හඳුනා නොගත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 1291 | 173672 | 6889 | 73290 | 7673 | 322 | 77 | **263214** |
| පෙබරවාරි | 981 | 140127 | 4167 | 77318 | 6051 | 269 | 84 | **228997** |
| මාර්තු | 1219 | 162238 | 4495 | 64506 | 6716 | 278 | 79 | **239531** |
| අප්‍රේල් | 1441 | 174226 | 6539 | 50803 | 6189 | 203 | 65 | **239466** |
| මැයි | 1381 | 160528 | 3845 | 25992 | 5510 | 215 | 166 | **197637** |
| ජූනි | 1280 | 170214 | 5539 | 29309 | 7752 | 132 | 123 | **214349** |
| ජූලි | 1247 | 172478 | 6489 | 64013 | 8014 | 219 | 56 | **252516** |
| අගෝස්තු | 1574 | 190817 | 5670 | 57852 | 6757 | 190 | 83 | **262943** |
| සැප්තැම්බර් | 1142 | 165091 | 5426 | 37059 | 4470 | 240 | 100 | **213528** |
| ඔක්තෝබර් | 1540 | 164019 | 4795 | 45334 | 5962 | 242 | 110 | **222002** |
| නොවැම්බර් | 1241 | 162192 | 5781 | 53113 | 5610 | 272 | 135 | **228344** |
| දෙසැම්බර් | 2100 | 208116 | 13669 | 76395 | 10908 | 428 | 75 | **311691** |
| **එකතුව** | **16437** | **2043718** | **73304** | **654984** | **81612** | **3010** | **1153** | **2874218** |





<u>**ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව මාසිකව - 2014**</u>




## ශ්‍රී ලංකාවට පැමිණි හා පිටවූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව -2014

| | පැමිණි සංඛ්‍යාව | | | පිටවූ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| මාසය | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශීය | පැමිණි මුළු සංඛ්‍යාව | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශීය | පිටත්වූ මුළු සංඛ්‍යාව |
| ජනවාරි | 108513 | 154701 | 263214 | 114613 | 173806 | 288419 |
| පෙබරවාරි | 81517 | 147480 | 228997 | 99665 | 151997 | 251662 |
| මාර්තු | 100688 | 138843 | 239531 | 102454 | 152194 | 254648 |
| අප්‍රේල් | 119014 | 120452 | 239466 | 115186 | 127841 | 243027 |
| මැයි | 101126 | 96511 | 197637 | 105712 | 103736 | 209448 |
| ජූනි | 104452 | 109897 | 214349 | 100331 | 101372 | 201703 |
| ජූලි | 111459 | 141057 | 252516 | 95517 | 108942 | 204459 |
| අගෝස්තු | 114226 | 148717 | 262943 | 127767 | 176085 | 303852 |
| සැප්තැම්බර් | 101019 | 112509 | 213528 | 129879 | 114948 | 244827 |
| ඔක්තෝබර් | 94113 | 127880 | 221993 | 103925 | 130882 | 234807 |
| නොවැම්බර් | 101694 | 126650 | 228344 | 101001 | 120233 | 221234 |
| දෙසැම්බර් | 125858 | 185833 | 311691 | 115208 | 142643 | 257851 |
| එකතුව | **1263679** | **1610530** | **2874209** | **1311258** | **1604679** | **2915937** |

## ශ්‍රී ලංකාවට පැමිණි සංඛ්‍යාව මාසිකව -2014




## ශ්‍රී ලංකාවෙන් පිටවූ සංඛ්‍යාව මාසිකව -2014



## නාවිකයන්ගේ පැමිණීම

ශ්‍රී ලංකාවට පැමිණෙන සියළුම නාවික කණ්ඩායම්වල සෑම සාමාජිකයෙකුගෙන්ම ශ්‍රී ලංකා රු.1,000.00ක රාජ්‍ය බද්ධක් අය කෙරේ. මීට අතිරේකව ශ්‍රී ලංකාවට ඇතුළුවීමට අවසර ලබා දෙන්නට ප්‍රථම ඔහු හෝ ඇය බැඳුම්කරයක්ද අත්සන් කල යුතු වේ.

මෙම බැඳුම්කරයේ ගාස්තුව ඔහුගේ හෝ ඇයගේ මෙරට නියෝජිතයා විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. තීරු සංකේත සහිත ස්ටිකරයක් නියෝජිතයාට වරාය ශාඛාවේදී නිකුත් කරනු ලැබේ.

## අභ්‍යන්තර ආගමන පාලනය

අභ්‍යන්තර ආගමන පාලනය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පියවර කිහිපයක් ගෙන තිබේ.

- **ශ්‍රී ලංකාවේ විදේශ ගමන් බලපත්‍රයක් ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීම ( Courier)**

  ආගමන විගමන පාලක ජනරාල්ගේ ලිඛිත අවසරයක් නොමැතිව ශ්‍රී ලංකාවේ විදේශ ගමන් බලපත්‍රයක් වෙනත් රටකට යැවීම වරදකි.

  කිසියම් රටක වීසා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විදේශ ගමන් බලපත්‍රයක් රටින් පිටට යැවීම සඳහා අවසර දෙනු ලබන්නේ අදාල රටේ තානාපති කාර්යාලයක් හෝ මහකොමසාරිස් කාර්යාලයක් ශ්‍රී ලංකාවේ නොමැති නම් පමණි.

- **තෙවන පාර්ශවයක් මාර්ගයෙන් විදේශ ගමන් බලපත්‍රයක් පිටත් කොට යැවීම**

## අවශ්‍ය ලේඛන

I. විදේශ ගමන් බලපත්‍රය පිටත්කර යැවීමට හේතු දක්වමින් ගමන් බලපත්‍රය හිමිකරුගෙන් ලබාගත් ඉල්ලීම් ලිපියක්

II. විදේශ ගමන් බලපත්‍රය හිමිකරුවා වෙනුවෙන් ඔහුගේ විදේශ ගමන් බලපත්‍රය රැගෙන යාමට තෙවැනි පුද්ගලයාට බලය ලබාදෙන ලිපියක්

III. අවශ්‍ය කාරණය සම්පූර්ණ වීමෙන් පසු ( උදා - වීසා ලබාගැනීමෙන් පසු) විදේශ ගමන් බලපත්‍රය එහි හිමිකරුවාට නැවත ලබාදෙන බවට තුන්වැනි පුද්ගලයාගෙන් ලබා ගත් ලිපියක්

- **විදේශ ගත වූ ශ්‍රමිකයින්ගේ ආගමන විගමන තොරතුරු පිළිබඳ ලිපි විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඉදිරිපත් කිරීම.**

- **තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ සම්පත් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.**

## විමර්ශන අංශය

වලංගු ගමන් ලියකියවිලි හෝ වලංගු වීසා බලපත්‍ර නොමැතිව විදේශිකයෙකු ශ්‍රී ලංකාවට ඇතුළුවීම සහ නැවතී සිටීම ආගමන විගමන පනත යටතේ වරදක් වේ.

ඒ අනුව ආගමන විගමන පනත උල්ලංඝණය කරන විදේශිකයන් පිළිබඳව සොයා බලා අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම සහ නෙරපීම සඳහා අවශ්‍ය මූලික කටයුතු කරනු ලබන්නේ විමර්ශන අංශය මඟිනි.

**2014 වසරේ එසේ රඳවා ගත් හා ඉවත් කළ සංඛ්‍යාව පහතින් දක්වා ඇත.**

| | **මාසය** | **රඳවාගත් සංඛ්‍යාව** | **ඉවත් කළ සංඛ්‍යාව** |
|---|---|---|---|
| 1 | ජනවාරි | 31 | 13 |
| 2 | පෙබරවාරි | 18 | 20 |
| 3 | මාර්තු | 13 | 15 |
| 4 | අප්‍රේල් | 18 | 9 |
| 5 | මැයි | 5 | 5 |
| 6 | ජූනි | 6 | 17 |
| 7 | ජූලි | 4 | 13 |
| 8 | අගෝස්තු | 11 | 1 |
| 9 | සැප්තැම්බර් | 1 | 5 |
| 10 | ඔක්තෝබර් | 3 | 6 |
| 11 | නොවැම්බර් | 9 | 8 |
| 12 | දෙසැම්බර් | 12 | 12 |
| | **එකතුව** | **131** | **124** |

**මිරිහාන රැඳවුම් කඳවුරට 2014 වර්ෂයේ ඇතුළත් කළ හා ඉවත් කළ පුද්ගලයින් සංඛ්‍යාව ජාතීන් අනුව වර්ගීකරණය**

| | ජාතිකත්වය | ඇතුළත් කළ සංඛ්‍යාව | ඉවත් කළ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බංගලාදේශ | 6 | 8 |
| 2 | බ්‍රිතාන්‍ය | 5 | 2 |
| 3 | එරිට්‍රියන් | 2 | 2 |
| 4 | කැනේඩියානු | 2 | 2 |
| 5 | චීන | 10 | 5 |
| 6 | ප්‍රංශ | 1 | 1 |
| 7 | ජර්මේනියානු | 4 | 2 |
| 8 | ඉන්දියානු | 53 | 51 |
| 9 | ඉරානියානු | 11 | 9 |
| 10 | ඉරිෂ් | 1 | 1 |
| 11 | ලයිබීරියානු | 1 | 1 |
| 12 | මාලදිවයින් | 0 | 1 |
| 13 | මාලි | 1 | 2 |
| 14 | මියන්මාර් | 7 | 7 |
| 15 | නයිජීරියානු | 0 | 3 |
| 16 | පකිස්තානු | 10 | 10 |
| 17 | පලස්තීනය | 3 | 3 |
| 18 | රුසියානු | 2 | 2 |
| 19 | ස්පාඤ්ඤ | 1 | 1 |
| 20 | සිරියානු | 7 | 7 |
| 21 | තුර්කියානු | 3 | 3 |
| 22 | යුක්රේනියානු | 1 | 1 |
| | **එකතුව** | **131** | **124** |

## නියමිත කාලසීමාව ඉක්මවා ශ්‍රී ලංකාවේ නැවතී සිටීම.

යම් පුද්ගලයෙකු නියමිත කාලසීමාව ඉක්මවා තවදුරටත් මෙරටේ නැවතී සිටින බවට අනාවරණය වුවහොත් අදාල පුද්ගලයා අත්ඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම සහ නෙරපීම සිදු කරනු ලබන අතර ඔහු හෝ ඇය නැවත මෙරටට ඇතුළුවීම වළක්වාලමින් ඔහුගේ හෝ ඇයගේ නම අසාධු ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

නියමිත කාලය ඉක්මවා රැඳී සිටි බව ඔහු හෝ ඇය පිටත්වන ස්ථානයේදී සොයාගනු ලැබුවහොත් අවස්ථානෝචිතව වීසා ගාස්තු සහ දඩමුදල් ගෙවනු ලැබිය යුතු වන අතර ඔහුගේ හෝ ඇයගේ නම පිරික්සුම් ලේඛනයේ ඇතුළත් කරනු ලැබේ. ඔහු හෝ ඇය නැවත මෙරටට පැමිණීමේදී ඔහු හෝ ඇය සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබිය හැකිය.

ඔහු හෝ ඇය අදාළ දඩ මුදල් නොගෙවනු ලැබුවහොත් ඔහුගේ හෝ ඇයගේ නම අසාධු ලේඛනයට ඇතුළත් කරනු ලබන අතර ඔහු හෝ ඇය නැවත මෙරටට ඇතුළුවීම වළක්වනු ලැබේ.

## විශේෂිත කාර්යයන්, ජයග්‍රහණ සහ අභියෝග

- සරණාගතභාවය අයදුම්කරන්නන් ලෙස ශ්‍රී ලංකාව තුල රැඳී සිටි පාකිස්ථානු ජාතිකයින් 329ක් සහ ඇෆ්ගනිස්ථානු ජාතිකයින් 88ක් නැවත ඔවුන්ගේ මව් රටට පිටත් කර යැවීම.
- සියළුම ගුවන් තොටුපල හා වරායවල ප්‍රත්‍යන්ත පාලන කටයුතුවල ප්‍රගමණය වෙනුවෙන් කරන ලද සේවා ඇගයීමක් ලෙස නියෝජ්‍ය පාලක (තොටුපල හා විමර්ශන) වෙත සමරු ඵලකයක් 2014.01.01 දින පාලක ජනරාල්තුමා විසින් පිරිනමන ලදී.

## විදේශීය කාර්ය මණ්ඩල සඳහා නිකුත් කරන ලද බැදුම්කර - 2014 වර්ෂය

| මාසය | බැදුම්කර ආදායම | කුරියර් සේවා ආදායම |
|---|---:|---:|
| ජනවාරි | 4,138,000.00 | 1,734,000.00 |
| පෙබරවාරි | 3,678,000.00 | 1,774,000.00 |
| මාර්තු | 3,753,000.00 | 2,223,000.00 |
| අප්‍රේල් | 3,931,000.00 | 2,055,000.00 |
| මැයි | 4,016,000.00 | 2,435,000.00 |
| ජුනි | 3,319,000.00 | 2,841,000.00 |
| ජූලි | 3,624,000.00 | 2,617,000.00 |
| අගෝස්තු | 4,132,000.00 | 2,437,000.00 |
| සැප්තැම්බර් | 3,826,000.00 | 2,098,000.00 |
| ඔක්තෝබර් | 3,771,000.00 | 2,144,000.00 |
| නොවැම්බර් | 3,588,000.00 | 2,114,000.00 |
| දෙසැම්බර් | 4418,000.00 | 1,769,000.00 |
| **එකතුව** | **46,194,000.00** | **26,241,000.00** |

## 05. තොරතුරු තාක්ෂණ හා මෙහෙයුම්

තොරතුරු තාක්ෂණ අංශයේ මූලික වගකීම වන්නේ දැනට පවත්නා මෘදුකාංග හා දෘඩාංග බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහ මහජනතාවට උපරිම සේවා පහසුව හා රජයට ප්‍රශස්ත පිරිවැයක් දැරෙන පරිදි නව ක්‍රමවේද හඳුන්වා දෙමින් තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම වේ.

එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමග නිසි පරිදි ගිවිසුම් යාවත්කාලීන කිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම ද මෙම අංශයේ තවත් කර්තව්‍යක් වේ.

**(1) ඉහතින් දැක්වූ මූලික කාර්යය භාරයට අමතරව පහත දැක්වෙන විශේෂිත කාර්යයන්ද තොරතුරු තාක්ෂණ අංශය මඟින් ඉටු කරනු ලැබේ.**

1. මහජන අවශ්‍යතා කෙරෙහි සංවේදී වෙමින් පවත්නා පරිගණක මෘදුකාංග මොඩියුලර් පහ සඳහා හඳුනාගත් වැඩිදියුණු කිරීම් සිදුකොට සේවා ඵලදායීතාව ඉහල නැංවීම.
2. ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) උපදේශනාත්මක දායකත්වය ඇතිව දෙපාර්තමේන්තුවේ සියලු අංශයන්හි ලිපි සැකසීමේදි භාවිතය සඳහා පොදු වූ සිංහල අකුරු ක්‍රමවේදයක් සඳහා අවශ්‍ය මෘදුකාංග සැකසීම.
3. දෙපාර්තමේන්තුව සඳහා බත්තරමුල්ලේ ඉදිවෙමින් පවතින නව ගොඩනැගිලි සංකීර්ණයෙහි පරිගණක පද්ධතිය මැනවින් ස්ථාපිත කිරීමෙහිලා අවශ්‍ය කටයුතු ඉටුකරදීම.
4. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ මග පෙන්වීම මත ආගමන හා විගමන කටයුතු වඩාත් ආරක්ෂාකාරී ලෙස සිදු කිරීම සඳහා වෙනත් රටක ගුවන් තොටුපලකින් රටට ඇතුළු කරගන්නා හා මෙරටින් පිටවීමට අවසර දෙනු ලබන ගුවන් යානයන්හි සිටින මගීන් පිළිබඳව දත්ත, අදාල ගුවන් යාන ගුවන්ගතවීමට පෙර ලබා ගත හැකි වන පරිදි, ගුවන් සමාගම් මඟින් එම දත්ත ගෙන්වා ගැනීම සඳහා එම අවස්ථාවේදී පැවති Advance Passenger Information(API) ක්‍රමවේදය Advance Passenger Processing (APP) දක්වා වැඩිදියුණු කිරීමට සැලසුම් කිරීම.
5. ගුවන් තොටුපල හා ගුවන් සේවා ආයතනයේ අවශ්‍යතාව මත බණ්ඩාරනායක ගුවන්තොටුපළෙහි Server room සියලු නවීකරණයන් සහිතව නව ස්ථානයක ස්ථාපිත කිරීම.

**(2) අස්ථානගත වූ සොරකම් කරන ලද ගමන්බලපත්‍ර ඒකකය (SLTD)**

අස්ථානගත වූ, සොරකම් කරන ලද ගමන්බලපත්‍ර පිළිබඳව පොලිස් ස්ථාන විසින් ලබා දෙන තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් ඍජුවම හෝ දෙපාර්තමේන්තුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබේ. ඒවා විමර්ශනය කොට, එම ගමන්බලපත්‍ර නැවත පරිහරණය කළ නොහැකි පරිදි අවලංගු කර, ජාත්‍යන්තර පොලීසිය (INTERPOL) වෙත යවනු ලබයි. එවැනි ගමන්

බලපත්‍රයක් මඟින් වෙනත් පුද්ගලයෙකු විදේශගත වීම වැලැක්වීමට පියවර ගෙන ඇති අතර, එවැනි නීති විරෝධී කටයුතු සිදුවීම වැලැක්වීම (SLTD) පද්ධතියේ මූලික අරමුණ වේ.

2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා මධ්‍යම තොරතුරු කාර්යාංශය (NCB) හා විදේශීය දූත මණ්ඩල (SLDM) විසින් ගමන් බලපත්‍ර 7865 ක් දෙපාර්තමේන්තුවට එවා ඇති අතර ගමන් බලපත්‍ර 5348 ක් ජාත්‍යන්තර පොලීසියේ දත්ත පද්ධතියට යවා ඇත.

වැඩිම අස්ථානගත වීමකට ලක්වන්නේ එක්සත් රාජධානියේදීය. එය 151 ක් වේ. ඉන්පසුව සිංගප්පූරුව වන අතර එය 22 කි.

**(3) ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS)**

ආගමන හා විගමන තොරතුරු හා සංඛ්‍යා ලේඛන ලබා දීම සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාලයන් සෘජුව සම්බන්ධතා පවත්වන්නේ මෙම අංශය සමඟ වන අතර අවශ්‍ය විටකදී වීසා නිකුත් කිරීමට පෙර විදේශ ගමන් බලපත් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම මෙම අංශය හරහා කරනු ලබයි.

2014.01.01 සිට 2014.12.31 දින දක්වා අප දෙපාර්තමේන්තුව මඟින් විමසුම් 2630 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

| **අංකය** | **ආයතනය** | **එකතුව** |
|---|---|---|
| 01 | ජර්මන් තානාපති කාර්යාලය | 469 |
| 02 | ප්‍රංශ තානාපති කාර්යාලය | 88 |
| 03 | නොර්වේ තානාපති කාර්යාලය | 86 |
| 04 | ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය | 302 |
| 05 | නෙදර්ලන්ත තානාපති කාර්යාලය | 3 |
| 06 | ඇමරිකානු තානාපති කාර්යාලය | 359 |
| 07 | ඉතාලි තානාපති කාර්යාලය | 15 |
| 08 | ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය | 104 |
| 09 | කැනඩා මහ කොමසාරිස් කාර්යාලය | 133 |
| 10 | එක්සත් රාජධානි මහ කොමසාරිස් කාර්යාලය | 183 |
| 11 | ඉන්දියානු සහකාර මහ කොමසාරිස් කාර්යාලය | 2 |
| 12 | බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය | 872 |
| 13 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය | 5 |
| 14 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 9 |
| | **එකතුව** | **2630** |

## 06. පුරවැසි අංශය

1948 අංක 18 දරණ පුරවැසි පනතින් පුරවැසි අංශය සඳහා ව්‍යවස්ථාපිත බලය ලැබී ඇත. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීමේ විධායක නිල බලය ලැබෙන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම්වරයාටය. පුරවැසි පනතේ ප්‍රතිපාදන සහ විධායක ක්‍රියාපටිපාටි ආගාමික හා විගාමික පනත යටතේ විදේශ දූත මණ්ඩලය හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සමග සෘජුවම සම්බන්ධ වන නිසා පුරවැසි අංශය ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ස්ථානගත කර ඇත.

පුරවැසි අංශය මඟින් 1948 අංක 18 දරණ පුරවැසි පනතේ ප්‍රතිපාදන පහත සඳහන් මූලික අංශ ඔස්සේ ක්‍රියාත්මක කරයි.

1. පනතේ 5(2) වගන්තිය මඟින් විදේශ රටවල උපත ලැබූ ශ්‍රී ලාංකික දරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීම.
2. පනතේ 19 වන වගන්තිය පරිදි ද්විත්ව පුරවැසිභාවය ප්‍රධානය කිරීම.
3. පනතේ 11,12,13,13අ වගන්ති ප්‍රකාරව ලියාපදිංචියෙන් පුරවැසිභාවය ප්‍රධානය කිරීම.
4. පනතේ 5අ හා 8 වගන්ති ප්‍රකාරව පරම්පරාවෙන් පුරවැසිභාවයට අදාල කටයුතු සිදු කිරීම.

**<u>පුරවැසි පනත අනුව 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා නිකුත් කරන ලද සහතික.</u>**

| පුරවැසි පනතේ අදාල වගන්තිය | ලැබුණු අයදුම් පත් සංඛ්‍යාව | නිකුත් කරන ලද සහතික පත් සංඛ්‍යාව |
|---|---|---|
| 5(2) වගන්තිය | 8155 | 8450 * |
| 8 වගන්තිය | 6 | 5 |
| 11 වගන්තිය | 54 | 22 |
| 12 වගන්තිය | 13 | 10 |
| 19 වගන්තිය | 293 | 255 |
| 19(1) පුරවැසිභාවය අත්හැරීම | 87 | 87 |

*පෙර වර්ෂයේ ලැබුණු, සහතික පත් නිකුත් කිරීමට නොහැකිවූ අයදුම්පත් සඳහා 2014 වර්ෂයේ සහතිකපත් නිකුත් කර ඇත.

### <u>2014 වර්ෂයේ ඉටු කරන ලද විශේෂ කාර්යයන්.</u>

1. ද්විත්ව පුරවැසිභාවයට අදාළව ලෙජර් වල තිබූ දත්ත සියල්ලම පද්ධතියට අතුලත් කරන ලදී.
2. පද්ධතිය මඟින් ද්විත්ව පුරවැසි සහතික අනු පිටපත් නිකුත් කිරීම 2014 වර්ෂයේ ආරම්භ කරන ලදී.
3. පුරවැසි දත්ත පද්ධතියට අනිකුත් දත්ත පද්ධති හා ඒකාබද්ධ කිරීමේ මූලික වැඩ කටයුතු ඉටුකරන ලදී.

# 07. ඉන්දු ලංකා පුරවැසි අංශය

ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන් වෙත පුරවැසිභාවය ප්‍රධානය කිරීම හා ඊට අනුෂාංගික කාර්යයන් ඉටු කිරීම මෙම අංශයේ කාර්ය භාරය වේ.මෙම කාර්ය භාරය ඉටු කිරීමේදී අදාල වන නීති පහත දැක්වේ.

1) 1948 අංක 18 දරණ පුරවැසිභාවය පිළිබඳ පනත

2) 1949 අංක 03 දරණ ඉන්දියානු හා පකිස්තානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත

3) 1967 අංක 14 දරණ ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත (සිරිමා ශාස්ත්‍රීය ගිවිසුම )

4) 1988 අංක 39 දරණ ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රධානය කිරීමේ පනත

5) 2003 අංක 35 දරණ ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රධානය කිරීමේ පනත

ඉහත කාර්යයන්ට අමතරව චීන සම්භවයක් ඇති ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රධානය කිරීමේ වගකීම 2008 අංක 38 දරණ පනත මඟින් පැවරී තිබුණු අතර එම පනතේ බලාත්මකභාවය 2013.10.30 දිනෙන් අවසන් විය. ඒ අනුව ඒ සම්බන්ධයෙන් මෙම අංශය වෙත පැවරී තිබුණු වගකීම හා කාර්යභාරය ද එදින සිට අවසන් විය. 2008 වර්ෂයේ සිට 2013.10.30 දින දක්වා කාලය තුල චීන සම්භවයක් සහිත පුද්ගලයන් 94 දෙනෙකු වෙත ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රධානය කොට ඇත.

ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයින්ට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රධානය කිරීමට අදාලව දැනට බලාත්මකව පවතින 1988 අංක 39 හා 2003 අංක 35 දරණ පනත් යටතේ පසුගිය අවුරුදු හයක කාලය තුල පුරවැසි සහතික නිකුත් කිරීමේ තත්වය පහත වගුවේ සඳහන් වේ.

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| 1988 අංක 39 | 172 | 106 | 71 | 14 | 09 | 19 |
| 2003අංක 35 | 24 | 61 | 04 | 08 | 02 | 03 |
| 2003 අංක 35 යටතේ දැනුම් දීමේ ලිපි නිකුත් කිරීම | 57 | 23 | 13 | - | 01 | - |

එසේම ලියාපදිංචියෙන් පුරවැසිභාවය ලබා ඇති පුද්ගලයින් හට අවශ්‍ය වන අවස්ථාවලදී තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර 2014 වර්ෂය තුල එවැනි ලිපි 60 ක් නිකුත් කර ඇත.

## 08. සංවර්ධන, ප්‍රතිපත්ති හා ප්‍රතිසංස්කරණ අංශය

මෙම අංශය මගින් **2014** වසරේ දී ඉටුකළ කාර්යයන් අතර, **2014** වර්ෂයට අදාළ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම **(Action Plan-2014) , 2013** වර්ෂයට අදාළ පාලන වාර්තාව සකස් කිරීම, දෙපාර්තමේන්තුව මඟින් නොයෙක් ආයතනවලට යැවිය යුතු ප්‍රගති වාර්තා ආදිය සකස් කර අදාළ ආයතනවලට යැවීමට කටයුතු කිරීම හා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම ආදී රාජකාරී කටයුතු ප්‍රධාන වේ. **2014** වර්ෂයේ දී සකස් කරන ලද කැබිනට් පත්‍රිකා හා ලැබී ඇති කැබිනට් අනුමැතීන් පහත පරිදි වේ.

<u>**2014 වසරේ දී ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ**</u>

**01.** ජෛවමිතික ගමන් බලපත්‍ර හඳුන්වාදීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

**02.** ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම විධිමත් කිරීම හා එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයෝ යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා 1948 අංක 18 දරණ පුරවැසිභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

**03.** රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර හිමි පුද්ගලයන් වීසා අවසර පත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කිරීම සඳහා ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රොමේනියානු රජය අතර එළඹෙනු ලබන ගිවිසුම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

**04.** ශ්‍රී ලාංකික ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා ජෛවමිතික (Biometrics ) තොරතුරු භාවිතා කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ලබා දීම සඳහා 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

**05.** බත්තරමුල්ලෙහි ඉදිකරනු ලබන පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල තුළ ආගමන විගමන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

**06.** විදේශ ගමන් බලපත් මුද්‍රණය හා පුද්ගලාරෝපනය කිරීමේ පරිගණක පද්ධතිය සඳහා වූ ආපදා ප්‍රතිකර්මීය උපස්ථක පද්ධතිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය.

ඊට අමතරව 2014 වර්ෂයේදී මෙම අංශය වෙත පැවරුනු විශේෂ කාර්යභාරය වූයේ බත්තරමුල්ලෙහි ඉදිකරනු ලබන පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල තුල 2015 වර්ෂයේදී දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීමය. මෙම කාර්යයේදී ඒ සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් තක්සේරු කිරීම හා කාර්යාල සැලැස්ම (Partitioned Plan ) සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකරනු ලැබූ අතර, ඒ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා අදාල අනෙකුත් ආයතන සම්බන්ධීකරණ කටයුතු ද ඉටුකරන ලදී.

## නීතිමය කටයුතු

දෙපාර්තමේන්තුවට අදාළ නීතිමය කටයුතු නියෝජ්‍ය පාලකවරයෙකුගේ මෙහෙයවීම යටතේ සංවර්ධන හා ප්‍රතිපත්ති අංශය හරහා සිදු වේ. **2014** වසර තුලදී ඉටු කර ඇති නීතිමය කාර්යයන් හා රාජකාරී පහත සඳහන් වේ.

1. ජෛවමිතික විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ව්‍යාපෘතියට අදාළව 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතට සිදුකළ යුතු සංශෝධනයන් සිදුකිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවෙමින් අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.
2. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් සිදුකරන නඩු පැවරීම් වලදී, අදාළ නඩු සඳහා ආගමන හා විගමන පාලක ජනරාල් සාක්ෂිකරුවකු ලෙස නම් කර ඇති අවස්ථාවල දී සාක්ෂි ලබාදීමට අදාළ ලේඛන සමඟින් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අවස්ථා 123 ක දී විවෘත අධිකරණයේදී සාක්ෂි ලබාදීමට කටයුතු කර ඇත.
3. දෙපාර්තමේන්තුව සහ පුද්ගලිකව පාලක ජනරාල් වගඋත්තරකරුවන් ලෙස නම් කරනු ලැබ, ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් ගොනු කර ඇති අවස්ථාවලදී එවැනි ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් 04 ක් සම්බන්ධයෙන් අවශ්‍ය නිරීක්ෂණ සකස් කිරීම සහ අවශ්‍ය ලේඛන අධිකරණය වෙත යොමු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව සමග කටයුතු කොට ඇත.
4. අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් අධිකරණ නියෝග මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේදී එම නියෝගයන්හි ඇති දෝෂ සම්බන්ධ ව අදාළ අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ට දැනුම්දීම සඳහා ලිපි 648 ක් සකස් කර අදාළ අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත යොමු කර ඇත.
5. දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති නඩු සඳහා 2014 වර්ෂය තුළ නියෝජ්‍ය පාලක (නීති) අවස්ථා 13 කදී කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිට ඇත.
6. දෙපාර්තමේන්තුව ඇති කරගන්නා ලද බඳු ගිවිසුම් 06 ක් සඳහා අවශ්‍ය නිරීක්ෂණ ඉදිරිපත් කර, 2013 වර්ෂය සඳහා ඒවා නැවත අළුත් කිරීම සඳහා කටයුතු කරන ලදී.
7. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට විරුද්ධව මානව හිමිකම් කොමිෂමට ඉදිරිපත් වූ අයදුම්පත් සම්බන්ධව අවස්ථා 9 ක දී දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අවශ්‍ය තොරතුරු ලබාදීමට කටයුතු කර ඇත.
8. දෙපාර්තමන්තුව දේශීය ආයතන සමඟ ඇති කරගත් ගිවිසුම් 24 ක් සඳහා අවශ්‍ය නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

# 09. මුල්‍ය කළමනාකරණය


ආගමන හා විගමන දෙපර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය, මුදල් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන මෙහි ආදායම් හා වියදම් පිළිබඳ කළමනාකරණය , රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු නියමිත සීමාවන් තුළ පවත්වාගෙන යාම, භාණ්ඩාගාරයේ නියමයන්ට අනුකූලව මුල්‍ය කටයුතු මෙහෙයවීම හා වාර්ෂික අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණකාධිකාරීවරයාගේ මූලිකත්වයෙන් ගණකාධිකාරී (ගෙවීම්) සහ ගණකාධිකාරී (ආදායම්) යන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුවේ.

## I. ආදායම් ඉලක්ක හා ප්‍රගතිය

2014 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු ගත මුළු ආදායම් ඉලක්කය රුපියල් මිලියන 7,173.25ක් වු අතර , උපයන ලද සත්‍ය ආදායම රුපියල් මිලියන 8,150.90ක් විය. ඒ අනුව ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවන ආදායමක් වාර්තාකර ඇති අතර, එය අපේක්ෂිත ආදායම් ඉලක්කයට වඩා සියයට 14 ක වර්ධනයකි.

**2014 වර්ෂයේ දෙපාර්තමේන්තුව ප්‍රධාන ආදායම් මූලාශ්‍ර තුළින් උපයන ලද ආදායම.**

| | | ආදායම (රුපියල්) |
|---|---|---|
| i | ගමන් බලපත් නිකුත් කිරීම් හා සංශෝධන | 2,133,548,086.72 |
| ii | විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් කටයුතු | 1,064,296,090.86 |
| iii | තොටුපල කටයුතු | 72,488,000.00 |
| iv | වීසා කටයුතු | 800,098,822.78 |
| v | විද්‍යුත් සංචරන වීසා වැඩසටහන (ETA) | 4,034,041,937.35 |
| vi | පුරවැසි අංශය | 46,423,010.00 |
| | **එකතුව** | **8,150,895,947.71** |




## II. ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම

2014 වර්ෂයේ දී දෙපාර්තමේන්තු වියදම් සඳහා ප්‍රතිපාදිත සමස්ථ ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 2,375.95ක් විය. එයින් රුපියල් මිලියන 880.85ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද, රුපියල් මිලියන 1,495.1ක් මුලධන වියදම් වෙනුවෙන්ද වෙන්කරන ලදී. 2014 වර්ෂයේ සමස්ථ තත්‍ය වියදම රුපියල් මිලියන 1,453.45ක් වු අතර එයින් සියයට 55.9 දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද, සියයට 44.1දෙපාර්තමේන්තුවේ මූලධන වියදම් වෙනුවෙන්ද වැයකර ඇත. 2014 වර්ෂයේ දී ප්‍රධාන වශයෙන් හිස් ගමන් බලපත් මිලදී ගැනීමටත්, වීසා ස්ටිකර් සඳහාත් මූලධන වියදම් දරා ඇත.

# 2014 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තුව හා වියදම්

| අංකය | | ක්‍රියාකාරකම් | වියදම් ඇස්තමේන්තුව 2014 (රු.දහස්) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.දහස්) | % |
| **1** | | පුද්ගල පඩිනඩි | 424,400 | 418,611 | 98.64 |
| **2** | | වෙනත් පුනරාවර්තන වියදම් | 456,450 | 394,043 | 86.33 |
| | | **පුනරාවර්තන වියදම්** | **880,850** | **812,654** | **92.26** |
| | | **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| **3** | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 4,100 | 3,828 | 93.37 |
| **4** | 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 55,000 | 22,861 | 41.57 |
| **5** | 2003 | වාහන | 3,500 | 3,492 | 99.77 |
| | | **මූලධන වත්කම් අත්පත්කර ගැනීම** | | | |
| **6** | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,500 | 1,498 | 99.87 |
| **7** | 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 23,000 | 14,523 | 63.14 |
| | | **මානව සම්පත් සංවර්ධනය** | | | |
| **8** | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 6,000 | 2,178 | 36.30 |
| | | **වෙනත් මූලධන වියදම්** | | | |
| **9** | 2502 | **ආයෝජන** | | | |
| | | 01. හිස්ගමන් බලපත් හා අදාළ උපාංග | 600,000 | 578,845 | 96.47 |
| | | 02. ජෛව මිතික ගමන් බලපත් හඳුන්වා දීම | 600,000 | - | |
| | | 03. යන්ත්‍රානුසාරයෙන් කියවැය හැකි විසා ස්ටිකර් ලේබල් | 15,000 | - | |
| | | 04. ලේඛන පරිලෝකනය කිරීම | 150,000 | - | |
| | | 05. වීසා ස්ටිකර් ලේබල් | 30,000 | 13,574 | 45.25 |
| | | 06. ද්විත්ව පුරවැසිභාවය ලැබූ අය සඳහා කාඩ්පත් නිකුත් කිරීම | 2,000 | - | |
| | | 07. ගමන් බලපත් හා වීසා අංශන සඳහා පෝලින් කලමනාකරණ ක්‍රමය | 5,000 | - | |
| | | **මුලු ප්‍රාග්ධන වියදම් එකතුව** | **1,495,100** | **640,799** | **42.86** |
| | | **මුලු එකතුව** | **2,375,950** | **1,453,453** | **61.17** |

# 10. ප්‍රසම්පාදන කටයුතු

ප්‍රසම්පාදන අංශය විසින් සෑම වර්ෂයක් ආරම්භයේ දීම එම වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලැබේ. එම ප්‍රසම්පාදන සැලැස්ම අනුව භාණ්ඩ හා සේවාවන් මිල දී ගන්නා අතර, 2014 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් වේ.

| **භාණ්ඩ** | **භාණ්ඩවල වටිනාකම** |
|---|---|
| කාර්යාලීය උපකරණ | 338,897.00 |
| වායුසමීකරණ යන්ත්‍ර | 2830,358.71 |
| මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ ඡායා පිටපත් යන්ත්‍ර | 835,600.00 |
| පරිගණක පද්ධතියට අදාල උපකරණ | 315,945.00 |
| වාහන | - |
| එකතුව | 4320800.71 |

# 11. සුභසාධන කටයුතු

## සුභසාධක සංගමය විසින් 2014 වර්ෂයේ දී සිදුකරන ලද විශේෂ කාර්යයන්

දහසක පමණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකත්වයකින් යුත් ආගමන හා විගමන සුභසාධක සංගමය, සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයගේ සහ පොදුවේ මුළුමහත් සමාජයේ සුභසිද්ධිය උදෙසා ආගමික, සමාජීය හා සංස්කෘතිකමය වශයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුලින් කායික හා මානසික වශයෙන් නිරෝගීමත් සේවක පිරිසක් බිහිකරමින්, ඔවුන්ගේ කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාව තුලින් මහජනතාවට වඩාත් ගුණාත්මක සේවයක් ලබාදීම අරමුණයි.

| අනු අංක | දිනය | වැඩසටහන |
|---|---|---|
| 1. | 1/1/2014 | සාමාජිකයින්ගේ පාසල් යන දරුවන් ප්‍රමාණය අනුව අභ්‍යාස පොත් කට්ටල ලබා දීම. |
| 2. | 3/1/2014 | රාජ්‍ය සේවා මළල ක්‍රීඩා උත්සවයට කණ්ඩායම් සහභාගී කරවීම |
| 3. | 21/3/2014 | මහ සභා රැස්වීම |
| 4. | 7/4/2014 | බැඩ්මින්ටන් තරඟාවලිය පැවැත්වීම |
| 5. | 7/5/2014 | කැරම් තරඟාවලිය පැවැත්වීම |
| 6. | 7/5/2014 | වස විස නැති ආහාර ප්‍රචලිත කිරීම සඳහා කාබනික ද්‍රව්‍ය යොදා සකස් කරන ලද ආහාර අඩංගු පොළක් පැවැත්වීම |
| 7. | 12/5/2014 | වෙසක් පොහොය නිමිත්තෙන් ධර්ම දේශනයක් පැවැත්වීම |
| 8. | 23/5/2014 | "Welcome" පණිවිඩ හුවමාරු මධ්‍යස්ථානය විවෘත කිරීම |
| 9. | 5/6/2014 | එක් සාමාජිකයෙකුට රු.2000 බැගින් අංශ අතර විනෝද චාරිකාව සඳහා රු.1,210,000 ක මුදලක් ලබා දීම. |
| 10. | 14/6/2014 | අංශ අතර ක්‍රිකට් තරඟාවලිය දුම්රිය ක්‍රීඩාංගනයේදී පැවැත්වීම |

| | | |
|---|---|---|
| 11. | 20/6/2014 | දෙපාර්තමේන්තුවේ ගායන හැකියාව ඇති සමාජිකයන් එළි දැක්වීම සඳහා **"සර හසර ගී ප්‍රසංගය "** - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීම |
| 12. | 9/7/2014 | ලේ දන් දීමේ වැඩසටහන - ලේ පයින්ට් 98 ක් ලේ බැංකුවට ලබා දීම. |
| 13. | 10/7/2014 | ඇසළ බණ - බණ්ඩාරවෙල අමිතානන්ද ස්වාමින් වහන්සේ සහභාගී වු ධර්ම දේශනාව |
| 14. | 11/7/2014 | දෙපාර්තමේන්තුව තුළ සංගීත රස වින්දනය සඳහා **"රසදීපනී"** වැඩසටහන සංවිධානය කිරීම.<br>පූජ්‍ය රඹුක්කන සිද්ධාර්ථ හිමි, මහින්ද දිසානායක මහතා, මහින්ද චන්ද්‍රසේකර මහතා හා ප්‍රේම් රංජිත් විජේවික්‍රම මහතාගේ සහභාගීත්වයෙන් දෙපාර්තමේන්තුවේ දී පවත්වන ලදී. |
| 15. | 18/11/2014 | සුහසාධක සංගමයට අධාර පිණිස **"නාදරමණී ආනන්දණීය ගීත ප්‍රසංගය"** මියුසියස් විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීම.<br>රෝහණ සිරිවර්ධන ,නිරෝෂා විරාජිනී, ටී.එම් ජයරත්න ,ලක්ෂ්මන් විජේසේකර, නිර්මලා රණතුංග, සමිතා මුදුන්කොටුව යන මහත්ම මහත්මීන්ගේ ගීතයෙන් හා රෝහණ වීරසිංහයන්ගේ සංගීතයෙන් රස ගැන්විනි. |
| 16. | 30/12/2014 | වසර අවසානයේ සතුටු සාජ්ජය |

## 2014.05.07 දින පවත්වන ලද වස විස නැති ආහාර ප්‍රචලිත කිරීම සඳහා කාබනික ද්‍රව්‍ය යොදා සකස් කරන ලද ආහාර අඩංගු පොළ



